# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 ජනවාරි මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2020.01.14 දින නිකුත් කරන ලදී)**


# ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එකී පනත යටතේ ජාතිය ගොඩනැගීමේ බදු අදාළ වීමේ කාලසීමාව 2019 දෙසැම්බර් මස 1 වන දිනට පෙරාතුව වූ කාලපරිච්ඡේදයට සීමා කිරීම වේ.

එල්.ඩී.—ඕ. 59/2019

# 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක       දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2019 අංක 20 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "සෑම තැනැත්තකුගෙන්ම අයකරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "2019 දෙසැම්බර් මස 1 වන දිනයට පෙරාතුව සෑම තැනැත්තකුගෙන්ම අයකරනු ලැබිය යුතු ය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.